නායකයින් විසින් ලබා දෙන බවට භාවිතයෙන්ම පෙන්වීම තුලින් මැතිවරණය පැවැත්වීමට ඇවැසි නිදහස් හා සාධාරණ පරිසරය ගොඩ නැගීමේ හැකියාව පවතී.

එය එසේ වුවද පසුගිය මැතිවරණ කිහිපයක් පිළිබඳව පැෆ්රල් සංවිධානයේ නිරීක්ෂණයන්ට අනුව, නිදහස් හා සාධාරණ  මැතිවරණ පැවැත්වීමට සුදුසු පරිසරයක් පැවතියේද යන්න පිළිබඳ ගැටළුවක් පැවතිණ. විශේෂයෙන්ම මෑතකාලීනව රටේ පැවැත්වූ පාර්ලිමේන්තු මැතිවරණයේදී එය අපට වැඩිදුරටත් තහවුරු වූයේ සමානුපාතික නියෝජන ක්‍රමය තළ එකම දේශපාලන ධාරාවේ පක්ෂ අතර මනාප ලබා ගැනීම අරඹයා ගැටුම් ඇතිවීමේ දැඩි ප්‍රවනතාවයක් පවතින බවයි.

එබැවින් මෙවර පළාත් පාලන මැතිවරණයද සමානුපාතික නියෝජන ක්‍රමය මත පදනම් වී පවත්වනු ලබන හෙයින්, ඔබගේ දේශපාලන පක්ෂය මැතිවරණ ව්‍යාපාරයේදී අනුගමනය කරන මූලික ප්‍රතිපත්තිමය රාමුව කුමක්ද යන්න පිළිබඳ ජනතාවත් විශේෂයෙන් ඔබ පක්ෂයේ අපේක්ෂකයනුත් දැනුවත් කරන්නේ නම් සහ එහි ප්‍රතිපත්ති රටේ පවතින නීතිය, මැතිවරණ නීතිය හා සාමය කඩකරන අපේක්ෂකයින් සම්බන්ධයෙන් පක්ෂයක් ලෙස ගන්නා විනය පියවර ප්‍රකාශයට පත් කිරීම ආදී ක්‍රියාමාර්ග සිදු කිරීම තුළින් අනෙකුත් කුඩා දේශපාලන පක්ෂ ද එය ආදර්ශයට ගනු ඇති අතර එය ඔබගේ දේශපාලන පක්ෂය කෙරෙහි මහජනතාවගේ ප්‍රසාදය වැඩිවීමට ද හේතුවක් වනු ඇත.

ඊට අමතරව පළාත් පාලන මැතිවරණ  ව්‍යාපාරයේදී බොහෝ ප්‍රචාරණ කටයුතු ග්‍රාමීය මට්ටමෙන් සිදුවන හෙයින්, එය එම ප්‍රදේශයන්හි පරිසරයට හානි නොවන ආකාරයට පොලිතින් වැනි නොදිරන ද්‍රව්‍ය අවම මට්ටමකින් භාවිත කරමින්, පරිසර හිතකාමී ප්‍රචාරක කටයුතු සිදු කිරීමට ඔබ පක්ෂයේ අපේක්ෂකයන්ට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙස අප ඉල්ලා සිටිමු.

එබැවින් රටේ පවතින නීතියට, මැතිවරණ නීතයට අනුව තම මැතිවරණ ව්‍යාපාරය ක්‍රියාත්මක කරමින් නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීමට අවශ්‍ය පරිසරයක් නිර්මාණය කිරීමට තම අපේක්ෂකයන්, ආධාරකරුවන්, සාමාජිකයන්ට අවශ්‍ය මඟපෙන්වීම ලබාදීමට ක්‍රියාකරනමෙන් ඔබතුමාගෙන් සහ ඔබතුමාගේ පක්ෂයෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තූතියි

මෙයට විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යක්ෂ